# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2060/2 – 2018 පෙබරවාරි 26 වැනි සඳුදා – 2018.02.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2014 මැයි මස 05 වැනි දින අංක 1861/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2014 අංක 95 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2012/LRB/223.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරීගේ අංකය: WGSWD&EIP/ACQ/MH/08.
2018 පෙබරවාරි මස 23 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල, 526/ඩී, ජම්බුගස්මුල්ල, 535/සී පැපිලියාන නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසවල, පැපිලියාන, ගංගොඩවිල ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කො 9623 සහ 2016.04.08 දිනැති මූලික පිඹුර අනුව සකසන ලද අංක සීඕ/ඩීඑස්ඕ/2017/220 සහ 2017.11.20 දිනැති දරන පැහැදිලි කිරීමේ අනුරේඛනයේ පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' – මාදන්ගහකුඹුර සහ අඹගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.1570**

උතුරට: මාදන්ගහකුඹුර සහ අඹගහකුඹුර සහ වරි. අංක 32/2/1 වෑකන්ද පාර; නැගෙනහිරට: වරි. අංක 42/2, වෑකන්ද පාර, වරි. අංක 61/14, වෑකන්ද පාර සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ කො 9623 හි මූලික පිඹුරේ කැබලි අංක 13; බටහිරට: කො 9623 මූලික පිඹුරේ කැබලි අංක 13 සහ 14.

**02. කැබලි අක්ෂර 'බී' – මාදන්ගහකුඹුර සහ අඹගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0050**

උතුරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ, වරි. අංක 61/14 වෑකන්ද පාර සහ මාර්ගය; නැගෙනහිරට: වෑකන්ද පාර, වරි. අංක නොදන්නා ඉඩම - වෑකන්ද පාර සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර සී; දකුණට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර සී, නුගේගොඩ ඇළ සහ මාර්ගය; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. **කැබලි අක්ෂර 'සී' – මාදන්ගහකුඹුර සහ අඹගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0016**

උතුරට: මාර්ගය සහ වරි. අංක නොදන්නා ඉඩම - වැකන්ද පාර; නැගෙනහිරට: වරි. අංක නොදන්නා ඉඩම - වැකන්ද පාර; දකුණට: නුගේගොඩ ඇළ; බටහිරට: මාර්ගය.

04. **කැබලි අක්ෂර 'ඩී' – දේවාලකුඹුර, හතාලිකොටුවේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0458**

උතුරට: කො 9463 මූලික පිඹුරේ කැබලි අංක 26; නැගෙනහිරට: කො 9463 මූලික පිඹුරේ කැබලි අංක 26 සහ කො 9467 මූලික පිඹුරේ කැබලි අංක 3; දකුණට: කො 9467 මූලික පිඹුරේ කැබලි අංක 4 සහ වරි. අංක නොදන්නා ඉඩම - සුනේත්‍රාදේවි පාර; බටහිරට: කො 9623 මූලික පිඹුරේ කැබලි අංක 19.

05. **කැබලි අක්ෂර 'ඊ' – දේවාලකුඹුර, හතාලිකොටුවේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.3600**

උතුරට සහ නැගෙනහිරට: නුගේගොඩ ඇළ; දකුණට: කො 9623 මූලික පිඹුරේ කැබලි අංක 11 සහ කො 9467 මූලික පිඹුරේ කැබලි අංක 13, 8 සහ 7; බටහිරට: කො 9467 මූලික පිඹුරේ කැබලි අංක 7 සහ 6.

06. **කැබලි අක්ෂර 'එෆ්' – ඉඩමේ නම සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0017**

උතුරට: කො 9623 මූලික පිඹුරේ කැබලි අංක 7 සහ වරි. අංක 94/17 පැපිලියාන පාර; නැගෙනහිරට: වරි. අංක 94/15 පැපිලියාන පාර; දකුණට: වරි. අංක 94/15 පැපිලියාන පාර සහ කො 9623 මූලික පිඹුරේ කැබලි අංක 7; බටහිරට: කො 9623 මූලික පිඹුරේ කැබලි අංක 7.

03 – 555

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.